# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2448/17 - 2025 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා - 2025.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතුකොට ගෙන මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 04 - ආරයම්පදි දකුණ කොට්ඨාසයට තේරී පත් වූ සෙල්ලත්තුරෙයි මාණික්කරාසා අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 04 - ආරයම්පදි දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුජිතා රාජාරවිදර්මා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සුජිතා රාජාරවිදර්මා, මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 04 - ආරයම්පදි දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරි,
මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 31 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 08 - 0063